III. "ප්‍රමාණික ලාභය" යනු කුමක්ද? ප්‍රමාණික ලාභය ආරෝපිත පිරිවැයේ කොටසක් ලෙස සලකනු ලබන්නේ ඇයි? (ලකුණු 05)

IV. කෙටිකාලයේ දී නිමවුම් මට්ටම වැඩි වීමත් සමඟ සාමාන්‍ය පිරිවැය වක්‍ර පහළ ගොස් පසුව ඉහළට ගමන් කරන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 03)

V. ස්වාභාවික ඒකාධිකාරයක් යනු කුමක්ද? (ලකුණු 02)

VI. පූර්ණ තරඟකාරී ආයතනයක කෙටිකාලීන නිෂ්පාදනයට අදාල රූප සටහනක් පහත දැක්වේ.




(a) භාණ්ඩයේ මිල රු. 20 ක් නම් ලබාගත හැකි ලාභය/ අලාභය සහ සාමාන්‍ය ස්ථාවර පිරිවැය ගණනය කරන්න.

(b) භාණ්ඩයේ මිල රු. 10 වුවහොත් කෙටි කාලයේ දී තවදුරටත් නිෂ්පාදන කටයුතුවල මෙම ආයතනය නිරත වේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

04. I. පහත සිද්ධීන් නිසා දළ දේශීය නිෂ්පාදිතයට ඇතිවන බලපෑම පැහැදිලි කරන්න.

(a) පුද්ගලයෙකු සමාගමකින් රු. 500,000 වැය කර කොටස් 5000 ක් මිලදී ගැනීම.
(b) රජය විසින් රු. මිලියන 200 ක් වියදම් කර නව පාලමක් ගොඩ නැගීම.
(c) රජය පාසල් සිසුන්ගේ මන්ද පෝෂණය අවම කිරීමට රු. මිලියන 100 ක් වියදම් කර විටමින් පෙති නොමිලේ ලබාදීම.
(d) ව්‍යාපාරිකයන් තමන්ගේ තොග මට්ටම් රු. මිලියන 20 ක ප්‍රමාණයකින් අඩු කිරීම.
(e) පුද්ගලයෙකු රු. මිලියන 03 ක් වියදම් කර මෝටර් රථයක් මිලදී ගැනීම.

(ලකුණු 05)

II. ජාතික ගිණුම්කරණ දත්තවල ප්‍රයෝජන මොනවාද? (ලකුණු 04)

III. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී සලකා නොබලනු ලබන ඵලදායී හා ඵලදායී නොවන ගණුදෙනු මොනවාද? (ලකුණු 06)

## "ආ" උප කොටස

06. I. මුදලට ඇති ඉල්ලුම තීරණය වන්නේ කෙසේ ද? (ලකුණු 06)

II. ණය ශ්‍රේණිගත කිරීමක් යනු කුමක්ද? ණය ශ්‍රේණිගත කිරීමක ඇති වැදගත්කම කුමක්ද? (ලකුණු 04)

III. එක්තරා වාණිජ බැංකු පද්ධතියකට අදාල ශේෂ පත්‍රය පහත දැක්වේ.

| වගකීම් (රු.මිලියන) | | වත්කම් (රු.මිලියන) | |
|---|---|---|---|
| හිමිකරු ප්‍රාග්ධනය | 800 | සංචිත | 400 |
| තැන්පතු | 1200 | සුරැකුම්පත් | 600 |
| | | ණය | 1000 |
| මුළු | 2000 | මුළු | 2000 |

වාණිජ බැංකු පද්ධතිය සතුව රු. මිලියන 100 ක අධි සංචිත පවතී.
(a) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය කොපමණ ද?
(b) අධි සංචිත සියල්ල ණය සඳහා වෙන් කළේ නම්, සියලු ගැලපුම් වලින් පසු බැංකු පද්ධතියේ පැවතිය හැකි තැන්පතු ප්‍රමාණය ගණනය කරන්න.
(c) මහජනතාව සතුව රු. මිලියන 5000 ක ව්‍යවහාර මුදල් පවතීනම්, සියලු ගැලපුම් වලින් පසු මුදල් සැපයුම කොපමණ ද?
(d) ජනතාව රු. මිලියන 500 ක මුදලක් බැංකු පද්ධතියේ තැන්පත් කළේ නම් මුදල් සැපයුමේ වැඩි වීම කොපමණ ද? (ලකුණු 06)

IV. පොලී අනුපාත කොරිඩෝව යනු කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

07. I. වෙළෙඳපොළ අසාර්ථක වීමක් සහ ආණ්ඩුව අසාර්ථක වීමක් අතර වෙනස කුමක්ද? (ලකුණු 04)

II. බාහිරතා නිසා ඇතිවන සම්පත් අකාර්යක්‍ෂම බෙදා හැරීම් අවම කරගත හැකි ක්‍රම මොනවාද? (ලකුණු 03)

III. ශ්‍රී ලංකාවේ බදු ආදායමේ මෑතකාලීන ප්‍රධාන මූලාශ්‍ර මොනවාද? (ලකුණු 05)

IV. බදු අය කිරීමේ "කාර්යක්‍ෂම බව" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 02)

V. ශ්‍රී ලංකාවේ අයවැය ලේඛණයේ මෑත කාලීන සමස්ථ ශේෂයේ උපනතීන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

VI. රටක් හිඟ අයවැය ලේඛනයක් පවත්වා ගැනීමේ ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 03)

08. I. රටක් අන්තර්ජාතික වෙළෙඳාමට සහභාගී වීමට බලපාන හේතු මොනවාද? (ලකුණු 03)

II. අන්තර්ජාතික වෙළෙඳාම සම්බන්ධව "ගතික" සාපේක්ෂ වාසි න්‍යාය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 04)

III. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සහ ආනයන හතර බැගින් ලියන්න. (ලකුණු 04)

IV. සතියක ශ්‍රමය භාවිතා කරමින් ශ්‍රී ලංකාවට සහ ඉංදියාවට නිපදවිය හැකි ඇඳුම් සහ වාහන ඒකක සංඛ්‍යාව පහත වගුවෙන් දැක්වේ.

| | ඉංදියාව | ශ්‍රී ලංකාව |
|---|---|---|
| ඇඳුම් (ඒකක) | 2 | 5 |
| වාහන (ඒකක) | 8 | 10 |

(a) එක් එක් භාණ්ඩය සඳහා නිරපේක්ෂ වාසි හිමිකරගෙන ඇත්තේ කුමන රටවල් විසින් ද? (ලකුණු 01)

(b) සාපේක්ෂ වාසි න්‍යාය අනුව එක් එක් රට විශේෂිකරණය විය යුත්තේ කුමන භාණ්ඩ සඳහාද? (ලකුණු 02)

(c) රටවල් දෙකේ අභ්‍යන්තර හුවමාරු අනුපාතයන් ගණනය කරන්න. (ලකුණු 02)

(d) රටවල් දෙකටම වාසි දායක වෙළෙඳාමක් සිදුවීමට නම් භාණ්ඩ හුවමාරු විය යුතු අනුපාතයන්ගේ පරාසය තීරණය කරන්න. (ලකුණු 02)

V. නාමික ආරක්ෂණ අනුපාතය සහ සඵල ආරක්ෂණ අනුපාතය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)

09\. I. තිරසාර ආර්ථික සංවර්ධනයක් ලඟාකර ගැනීමට ආර්ථිකයක් විසින් ලඟාකර ගතයුතු අවශ්‍යතා මොනවාද? (ලකුණු 03)

II. ආර්ථික වෘද්ධිය හා තිරසාර ආර්ථික සංවර්ධනය එකිනෙක ගැටෙන සුළු අරමුණු වශයෙන් සලකනු ලබන්නේ ඇයි? (ලකුණු 04)

III. රටක ආර්ථික සංවර්ධනය මැනීමට ප්‍රතිශීර්ෂ (ඒක පුද්ගල) ආදායම යොදා ගැනීමේ දුර්වලතා මොනවාද? (ලකුණු 04)

IV. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකයේ මෑතකාලීන උපනතීන් පරීක්ෂා කරන්න. (ලකුණු 03)

V. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකය අනෙකුත් දකුණු ආසියාතික ආර්ථික වලට වඩා ඉදිරියෙන් පවතිනුයේ ඇයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

VI. සාර්ව ආර්ථික විචක්ෂණශීලී ප්‍රතිපත්ති යනු කුමක්ද? (ලකුණු 02)

10\. I. ආදායම් දරිද්‍රතාවය සහ මානව දරිද්‍රතාවය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

II. ශ්‍රී ලංකාවේ මෑත කාලීන දරිද්‍රතාවයේ සුවිශේෂී ලක්ෂණ මොනවාද? (ලකුණු 04)

III. ශ්‍රී ලංකාව ඉහළ ආදායම් රටවල් කාණ්ඩයට අයිති වීමට නම්, ප්‍රතිශීර්ෂ (ඒකපුද්ගල) ආදායම ඇ.ඩො. 4000 කට වඩා වැඩි විය යුතුය. ශ්‍රී ලංකාවට මෙම සීමාව ලඟාකර ගැනීම සඳහා ඇති අභියෝග මොනවාද? (ලකුණු 04)

IV. ශ්‍රී ලංකා රජය දරිද්‍රතාවය අවම කිරීම සඳහා මෑත කාලීනව ගෙන ඇති පියවර මොනවාද? (ලකුණු 04)

V. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂි කර්මාන්තයේ අඩු ඵලදායීතාවයක් පවතින්නේ ඇයි? කරුණු දක්වන්න. (ලකුණු 04)

Uva Province Sipsara Udana & studentlanka.com